**වැලිගෙපොල ප්‍රාදේශීය සභාව**
**රත්නපුර දිස්ත්‍රික්කය**
**-----------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**-----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**----------------------------------**

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ජූනි 18 දින සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
**-------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට වැලිගෙපොල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
**--------------------------------------**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**
**------------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2017 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව මගින් අපහරණය කිරීමට නිර්දේශ කර තිබුණු එකතුව රු. 66,453 ක වත්කම් මූල්‍ය ප්‍රකාශන තුල ගැලපීම් කර තිබීම හේතුවෙන් ස්ථාවර වත්කම් එම වටිනාකමින් අඩුවෙන් දැක්වුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාල සත්‍ය මුද්දර ගාස්තු හා උසාවි දඩ ආදායම හඳුනාගෙන නොතිබුණු අතර, එකතුව රුපියල් මිලියන 06 ක් වූ ඇස්තමේන්තුගත ආදායම් ගිණුම්ගත කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් විගණන ගාස්තු සඳහා වෙන්කිරීම් සිදුකර නොතිබුණි.

**1.3.2 නොසැසඳුණු ගිණුම්**
**-----------------------**

ගිණුම් විෂයයන් 02 කට අදාලව සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන් සහ උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු. 1,232,362 ක වෙනසක් විය.

**1.3.3 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**
**--------------------------------------------------------**

දේපල පිරියත හා උපකරණ වල 2017 දෙසැම්බර් 31 දිනට වූ එකතුව රු. 50,941,371 ක ශේෂය තහවුරු කරගැනීම සඳහා අවශ්‍ය විස්තරාත්මක උපලේඛන විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

### 1.3.4 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම් |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | |
| | 204 වන රීතිය | 50,270 | 2016 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාව මගින් අනාවරණය කර තිබුණු වත්කම් විෂයය 03 කට අයත් ඒකක 48 ක ඌනතා සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | |
| | (i) මුදල් රෙගුලාසි 371(2)ඇ | 2,595,105 | 1988 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ ලබාදී තිබුණු අත්තිකාරම් පියවා නොතිබුණි. |
| | (ii) මුදල් රෙගුලාසි 571(3) | 468,785 | 1988 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදයට අදාල තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | 2009 මාර්තු 09 දිනැති හා අංක 2009/1 දරන පළාත් පාලන කොමසාරිස් චක්‍රලේඛය | | වර්ෂ 05 කට වරක් බදු කුලී සංශෝධනය කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 3,966,680 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 6,924,307 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2017 ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2016 ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම - | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| ---------- | ------------------- | ------ | ----------- | -------------- | ------------------- | ------ | ------- | ----------- |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 6,832,725 | 9,076,249 | 7,984,217 | 4,787,515 | 4,248,500 | 8,365,512 | 7,061,067 | 4,121,595 |
| කුලී | 2,340,297 | 1,790,628 | 1,860,149 | 159,072 | 2,716,455 | 2,071,066 | 1,884,578 | 244,435 |
| බලපත්‍ර ගාස්තු | 1,155,300 | 1,422,234 | 1,422,234 | - | 931,900 | 1,130,882 | 1,180,332 | 5,000 |
| වෙනත් ආදායම් | 8,939,900 | 8,348,354 | 3,019,897 | 11,541,330 | 58,684,717 | 5,079,761 | 34,870,420 | 5,803,140 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම, රැස්කල ආදායම සමඟ සැසඳීමේදී වරිපනම් හා බදු, බලපත්‍ර ගාස්තු හා සේවා සඳහා ගාස්තු යන ආදායම් විෂයයන්ගෙන් රැස්කල ආදායම් අයවැයගත ප්‍රමාණයට වඩා පිළිවෙලින් සියයට 17, සියයට 23 හා සියයට 05 කින් වැඩි වී තිබූ අතර බදුකුළී, වරෙන්තු හා දඩ, වෙනත් ආදායම් හා රජයේ දායකත්වය යන ආදායම් විෂයයන්ගේ රැස්කල ආදායම අයවැයගත ප්‍රමාණයට වඩා පිළිවෙලින් සියයට 21, සියයට 87, සියයට 85 හා සියයට 53 කින් අඩුවී තිබුණි.

### 2.2.3 වරිපනම්

2017 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් බදු ශේෂය රු. 4,703,281 ක් වූ අතර එම හිඟ බදු අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්වයක පැවතුණි.

### 2.2.4 වෙනත් ආදායම්

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභා බල ප්‍රදේශය තුල ප්‍රදර්ශනය කර තිබුණු ප්‍රචාරක දැන්වීම් පුවරු 04 ක් සඳහා අයවිය යුතු එකතුව රු. 190,000 ක් අයකර ගැනීමට අපොහොසත්ව තිබුණි.

(ආ) අයවීම් හිඟහිට තිබුණු එකතුව රු. 766,458 ක් වූ ජල ගාස්තු අයකරගැනීමට සභාව අපොහොසත් වී තිබුණි.

### 2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2015 ජනවාරි සිට 2017 දෙසැම්බර් දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා බලංගොඩ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හා 2016 සැප්තැම්බර් සිට 2017 දෙසැම්බර් දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා ඇඹිලිපිටිය ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් අයවියයුතු හිඟ මුද්දර ගාස්තු ආදායම හඳුනාගෙන අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අයවිය යුතු රු. 1,523,936 ක උසාවි දඩ ආදායම අයකර ගැනීමට අපොහොසත්ව තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

#### (අ) ක්‍රියාකාරී සැලැස්ම

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

#### (ආ) අපේක්ෂිත නිමවුම් මට්ටම ලබානොගැනීම

පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කර තිබුණු ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ ජාතික වැඩසටහන යටතේ වැලිගෙපොල සතිපොළ සංවර්ධනය - ii අදියර සඳහා රු. 3,907,140 ක ප්‍රතිපාදන ලබා දී තිබුණද, සමාලෝචිත වර්ෂය තුල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සභාව අපොහොසත් වී තිබුණි.

#### (ඇ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

සභාව විසින් රැස්කරන දිරන කසළ විවෘත භූමියකට බැහැර කර පස්දමා වසා දැමීම සිදුකරමින් පැවති අතර, කසළ කළමනාකරණය සම්බන්ධයෙන් විධිමත් වැඩසටහනක් සැලසුම් කර ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වී තිබුණි.

#### (ඈ) තිරසර සංවර්ධන ඉලක්ක

තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත්ව නොසිටීම හේතුවෙන් එම අරමුණු සඳහා වන ගෝලීය දර්ශක තුළින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් 2018 මැයි වනවිටත් සකස් කර නොතිබුණි.

### 3.2 මානව සම්පත් කළමනාකරණය

#### සේවක ණය

විශ්‍රාම යාම, ස්ථාන මාරු ලැබීම හා සේවය හැරයාම යන හේතූන් මත නිලධාරීන් 06 දෙනෙකුට අදාළව අයවීම් හිඟහිට ඇති ණය ශේෂ එකතුව රු. 103,374 ක් විය.

### 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

සභා බල ප්‍රදේශය තුල ජීවත්වන ජනතාවගේ පානීය ජල අවශ්‍යතා සපුරාලනු පිණිස සභාව විසින් ක්‍රියාත්මක කර තිබුණු ජල ව්‍යාපෘති 05 ක් මගින් සපයන ජලයෙහි අහිතකර කොලිෆෝම් බැක්ටීරියාවන්

පවතින බව ජල සාම්පල් පරීක්ෂාවේදී තහවුරු වී තිබුණි. එබැවින් එම ජල ව්‍යාපෘති මඟින් සපයන ජලය දෛනිකව ක්ලෝරිනීකරණය කලයුතු බව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී විසින් අවධාරණය කර තිබූ අතර, සභාවේ නිලධාරීන්ට ක්ලෝරිනීකරණය පිළිබඳ පුහුණුවක්ද ලබා දී තිබුණි. එහෙත් ජලය ක්ලෝරිනීකරණය කිරීම විධිමත්ව හා අඛණ්ඩව ක්‍රියාත්මක කර නොතිබීම හේතුවෙන් ජනතාව අතර වසංගත රෝග පැතිර යාමේ අවදානමක් පැවතුණි.

**3.4 ප්‍රසම්පාදනය**

**---------------**

**ප්‍රසම්පාදන සැලැස්ම**

**-----------------------**

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**----------------------------------------**

**4.1 අයවැය පාලනය**

**------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 12 කට අදාලව එකතුව රු. 210,000 ක්වූ මුළු ප්‍රතිපාදනයම උපයෝජනය කර නොතිබුණි.

(ආ) වැය විෂයයන් 20 ක් සඳහා සලසා දී තිබුණු එකතුව රු. 5,575,000 ක් වූ මුළු ප්‍රතිපාදනයෙන් සියයට 50 සිට සියයට 99 දක්වා පරාසයක ඉතිරිවීම් පැවතුණි.

**4.2 විගණන හා කළමනාකරණ කමිටු**

**-------------------------------------**

විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා ක්‍රියාත්මක කිරීම සඳහා පියවර ගෙන නොතිබුණි.

**5. පද්ධති හා පාලන**

**--------------------**

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතුය.

| | පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණය | (i) | වියදම් හඳුනා නොගැනීම |
| | | (ii) | ආදායම් හඳුනා නොගැනීම |
| | | (iii) | ලෙජර් ගිණුම් හා උපයෝගී ලේඛන නොසැසඳීම |
| (ආ) | ආදායම් පරිපාලනය | | නියමිත ආදායම් අයකර නොගැනීම |
| (ඇ) | අයවැය පාලනය | | ප්‍රතිපාදන ඉතිරිවීම |